# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**
නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල

වැදගත් කරුණු:

- **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** 2017 ජූනි මාසයේ දී 56.1 ක දර්ශක අගයක් වාර්තා කරමින්, 2017 මැයි මාසයට සාපේක්ෂව දර්ශක අගයයන් 1.8 කින් පහළ යන ලදී. අහිතකර කාළගුණික තත්ත්වයන්ගේ යම් පමණකට වූ බලපෑම මත, නව ඇණවුම් සහ නිෂ්පාදන උප දර්ශකයන්ගේ පහළ යෑම 2017 ජූනි මාසයේ දී නිෂ්පාදන ක්‍රියාකාරකම් මැයි මාසයට සාපේක්ෂව අඩු වේගයකින් වර්ධනය වීමට හේතු විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ගැණුම් තොග මට්ටම ඉහළ ගිය අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප දර්ශකය සුළු වශයෙන් පහළ යන ලදී. කෙසේ වුවද, පසුගිය මාසයේ දී වාර්තා කළ පහත වැටීමට සාපේක්ෂව සේවා නියුක්ති උප දර්ශකය මෙම මාසය තුළ දී ඉහළ යෑමක් පෙන්නුම් කරන ලදී. තවද, සියලුම උප දර්ශක කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කරන ලදී. තවද, ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් යහපත් වර්ධනයක් පෙන්නුම් කරයි.

- **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** 2017 මැයි මාසයේ දී වාර්තා වූ 55.3 ක දර්ශක අගයට සාපේක්ෂව ජූනි මාසයේ දී, 59.2 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී. සේවා අංශයෙහි මෙම වර්ධනයට නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම්, සේවා නියුක්තිය සහ ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් හේතු විය. 2017 මැයි මාසයට සාපේක්ෂව නිම කිරීමට ඇති කාර්යයන් සුළු වශයෙන් පහළ යන ලදී. මූල්‍ය අංශය තම සේවාදායකයන්ට සේවා සැපයීම සඳහා නව තාක්ෂණික ක්‍රමෝපායන් භාවිතා කිරීම, නව ව්‍යාපාර උප දර්ශකයෙහි වර්ධනය සඳහා දායක විය. ව්‍යාපාර ක්‍රියාකාරකම් උප දර්ශකයෙහි සිදු වූ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් සෞඛ්‍ය අංශය දායක විය. දේශීය සහ විදේශීය සංචාරක කටයුතුවල අපේක්ෂිත වර්ධනය හේතුවෙන් නවතැන් සහ ආහාරපාන සැපයීමේ අංශයෙහි ඉදිරි මාස 3හි ව්‍යාපාර ක්‍රියාකාරකම්වල වර්ධනයක් අපේක්ෂා කෙරේ. උත්සව සමයක් සමග ඇතිවන විශේෂ ඉල්ලුම් ඉහළ යෑමක් නොපැවතීම හේතුවෙන්, මැයි මාසයට සාපේක්ෂව 2017 ජූනි මාසයේ දී අය කරන මිල ගණන් උප දර්ශකය නොවෙනස්ව පැවතුණි. මේ අතර, සේවා නියුක්ති මට්ටම ඉහළ යෑම හේතුවෙන් 2017 ජූනි මාසයේදී අපේක්ෂිත ශ්‍රම පිරිවැය සුළු වශයෙන් ඉහළ ගියේය.

| | වා\මා | ජන. | පෙබ. | මාර්. | අප්‍රේ. | මැයි | ජූනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **2015** | n.a. | n.a. | n.a. | n.a. | 67.3 | 57.5 | 55.5 | 56.5 | 53.2 | 57.8 | 54.8 | 57.9 |
| | **2016** | 51.9 | 55.3 | 60.7 | 41.6 | 47.9 | 55.1 | 50.6 | 53.5 | 57.7 | 56.5 | 58.4 | 58.3 |
| | **2017** | 56.2 | 57.1 | 66.5 | 41.8 | 57.9 | 56.1 | - | - | - | - | - | - |
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **2015** | n.a. | n.a. | n.a. | n.a. | 66.8 | 65.0 | 60.6 | 59.8 | 61.7 | 59.5 | 59.3 | 60.2 |
| | **2016** | 58.0 | 59.3 | 61.6 | 54.7 | 58.1 | 56.3 | 57.8 | 61.2 | 57.7 | 59.3 | 59.7 | 59.8 |
| | **2017** | 57.5 | 57.3 | 60.8 | 54.2 | 55.3 | 59.2 | - | - | - | - | - | - |

## නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




## සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය



තාක්ෂණික සටහන:

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍යය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.